# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 නොවැම්බර් මස 15 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 නොවැම්බර් මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

**2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත**

[සහතිකය සටහන් කළේ 2012 නොවැම්බර් මස 15 වැනි දින]

එල්. ඩී.—ඕ. 19/2008.

**(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** (1) මේ පනත 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා අදාළ වීම.

(2) මේ පනතේ 5, 9 හා 13 වන වගන්තිවල විධිවිධාන 2012 අංක 21 දරන පනත මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) විධිවිධාන ප්‍රකාරව පවත්වනු ලබන ඡන්ද විමසීමක දී යම් මහ නගර සභාවක නගරාධිපතිවරයකු හෝ අවස්ථාවෝචිත පරිදි යම් නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා අදාළ විය යුතු ය.

I වන කොටස

**(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතට කරනු ලබන සංශෝධන**

**2.** (මෙහි මින් මතු මෙම කොටසෙහි ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— 252 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“මහ නගර සභාවේ සංයුතිය.

5. (1) සෑම එක් එක් මහ නගර සභාවක් ම:—

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 3අ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් වශයෙන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක දී මහ නගර සභාව තුළ නියෝජනයක් නොලැබූ ඡන්දදායකයින්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයන් වශයෙන් තෝරා පත්කර යැවිය යුතු, එම ආඥාපනතේ 3ඇ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන්ගෙන් සියයට තිහක් නොඉක්මවනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් "පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ 66අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව පිරවිය යුතු අතර, එසේ තෝරා පත් කරගනු ලැබූ තැනැත්තා සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා වන ඊළඟ මහා මැතිවරණය තෙක් සභිකයකු වශයෙන් ධුරය දැරිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ආ) තම ධුරයෙන් ඉල්ලා අස්වෙන හෝ තම ධුරය හිස් කරනු ලබන නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා කෙසේ වුව ද, සභිකයකු ලෙස දිගට ම කටයුතු කළ යුතු ය."; සහ

(2) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(7) මහ නගර සභාවක නගරාධිපතිවරයාගේ ධුරය පුරප්පාඩු වූ ඕනෑ ම අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිළිබඳව කොමසාරිස්වරයා විසින් වහා ම පළාත් පාලන කොමසාරිස්වරයා වෙත දැන්විය යුතු අතර, එවිට, එම පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට කටයුතු කළ යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ 3 වන උපවගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"(3) නගරාධිපතිවරයා හැර යම් සභිකයකු,

(අ) සෑම සභිකයකු ම යටත් පිරිසෙයින් එක් ස්ථාවර කාරක සභාවක සේවය කිරීම සඳහා තෝරා පත්කර ගන්නා තෙක්, ස්ථාවර කාරක සභා දෙකකට තෝරා පත්කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය;

(ආ) සෑම සාමාජිකයකු ම යටත් පිරිසෙයින් ස්ථාවර කාරක සභා දෙකක සේවය කිරීම සඳහා තෝරා පත්කර ගන්නා තෙක්, ස්ථාවර කාරක සභා තුනකට තෝරා පත්කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය:

එසේ වුව ද, සභිකයකු කිසිම අවස්ථාවක ස්ථාවර කාරක සභා තුනකට වඩා වැඩි ගණනකට තෝරා පත්කර ගැනීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 189 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 189 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

''මහ නගරසභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් චෙක්පත් අණකර ආදිය.

189. මහනගර සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර, තත්කාර්ය සඳහා මහනගර සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද සභාවේ නගරාධිපතිවරයා නොවන, වෙනත් නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එකී අරමුදල පිහිටුවා ඇත්තේ යම් බැංකුවක ද, ඒ බැංකුව විසින්, එසේ අත්සන් කරන ලද සියලු අණකර හා චෙක්පත් වෙනුවෙන් අරමුදලින් ගෙවීම් කරනු ලැබිය හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 215 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වගන්තිය එහි ''හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සැලකිය යුතු ය.'' යන වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, සභාවේ නිල කාලය ආරම්භ වී වසර දෙකකින් ඉක්බිතිව නගරාධිපතිවරයා විසින්, කවර හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් මෙම ආඥාපනතේ 214 වන සහ 215 වන වගන්ති අනුව කටයුතු කිරීමෙන් අනතුරුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයේ සියලුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එකතු කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට නගරාධිපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අයවැය ලේඛනය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු ය. එය එසේ දෙවන වරටත් නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලය අවසන් වීමෙන් පසුව නගරාධිපතිවරයා ස්වකීය නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු ය.'';

## II වන කොටස

## (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතට කරනු ලබන සංශෝධන

255 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. (මෙහි මින් මතු මෙම කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නගර සභාවේ සංයුතිය.

5. (1) සෑම එක් එක් නගර සභාවක්ම:—

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඇ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන් සංඛ්‍යාවකින් ; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක දී, මහ නගර සභාව තුළ නියෝජනයක් නොලැබූ ඡන්ද දායකයන්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයන් වශයෙන් තෝරා පත් කර යැවිය යුතු එම ආඥාපනතේ 3ඇ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන්ගෙන් සියයට තිහක් නොඉක්මවනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.'';

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ සම්බන්ධයෙන් තත්කාලයේ අදාළ වන යම් ලිඛිත නීතියක විධිවිධාන" යන වචන වෙනුවට "(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ 66අ වගන්තියේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "තත්කාලයේ අදාළ වන යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව" යන වචන වෙනුවට "(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "ධුරය දැරිය යුතු ය. සභාපතිවරයකු හෝ උපසභාපතිවරයකු ස්වකීය ධුරය හිස් කළ කවර අවස්ථාවක වුව ද, ඔහු සභිකයකුව සිටීම ද ඒ සමගම අවසන් වන්නේ ය." යන වචන වෙනුවට "ධුරය දැරිය යුතු ය. සභාපතිවරයා හෝ උපසභාපතිවරයා ධුරයෙන් ඉල්ලා අස්වුව ද, සභාවේ සභිකයකු ලෙස ධුර දැරිය යුතු ය.". යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට මෙහි පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(7) නගර සභාවක සභාපතිවරයාගේ ධුරය හිස් වූ කවර අවස්ථාවක වුව ද, එම පුරප්පාඩුව පිළිබඳ නිවේදනය සභාවේ ලේකම්වරයා විසින් වහා ම පළාත් පාලන කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු අතර, එම පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලින් සලසා ඇති ආකාරයට, එම පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා ක්‍රියා කළ යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය එහි 2 වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) නගර සභාවේ ප්‍රාදේශීය අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමතයට යටත්ව, තත්කාර්ය සඳහා නගර සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද, සභාවේ සභාපතිවරයා නොවන වෙනත් නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එකී අරමුදල පිහිටුවා ඇත්තේ යම් බැංකුවක ද, ඒ බැංකුව විසින් එසේ අත්සන් කරන ලද සියලු අණකර හා චෙක්පත් වෙනුවෙන් අරමුදලින් ගෙවීම් කරනු ලැබිය හැකි ය.".

12. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 178අ වගන්තිය එහි "හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සැලකිය යුතු ය." යන වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 178අ වගන්තිය සංශෝධනය කිරීම.

"හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, නිල කාලය ආරම්භ වී වසර දෙකකින් ඉක්බිතිව සභාපතිවරයා විසින්, කවර හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් මෙම ආඥාපනතේ 178 වන සහ 178අ වගන්ති අනුව කටයුතු කිරීමෙන් අනතුරුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයේ සියලුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එකතු කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අයවැය ලේඛනය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු ය. එය එසේ දෙවන වරටත් නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලය අවසන් වීමෙන් පසුව සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 184 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 184 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ ''තත්කාර්යයට අදාළව තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියකින්'' යන වචන වෙනුවට ''සහ (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 249 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 249 වන වගන්තියේ ''සභාපතිවරයා සහ උපසභාපතිවරයා'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ ''තත්කාර්යයට අදාළව තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට'' යන වචන වෙනුවට ''පළාත් පාළන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

## III වන කොටස

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට කරනු ලබන සංශෝධන

1987 අංක 15 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** (මේ කොටසේ මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

''ප්‍රාදේශීය සභාවේ සංයුතිය.

4(1). 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් පිහිටුවන ලද සෑම ප්‍රාදේශීය සභාවක් ම:—

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඇ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක

දී, සභාව තුළ නියෝජනය නොලැබූ ඡන්දදායකයන්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයන් වශයෙන් තෝරාපත් කර යැවිය යුතු, එම ආඥාපනතේ 3ඇ වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන්ගෙන් සියයට තිහක් නොඉක්මවන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්ය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව, එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.''.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත්, අණකර ආදිය.

133 ප්‍රදේශීය සභාවේ ප්‍රාදේශීය අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර, කොමසාරිස්වරයාගේ අනුමතයට යටත්ව, තත්කාර්ය සඳහා ප්‍රදේශීය සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද, සභාවේ සභාපතිවරයා නොවන වෙනත් නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එකී අරමුදල පිහිටුවා ඇත්තේ යම් බැංකුවක ද, ඒ බැංකුව විසින්, එසේ අත්සන් කරන ලද සියලු අණකර හා චෙක්පත් වෙනුවෙන් අරමුදලින් ගෙවීම් කරනු ලැබිය හැකි ය.''.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය, එහි "ලැබිය යුතු ය." යන වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැකවෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ලැබිය යුතු ය:

එසේ වුව ද, සභාවේ නිල කාලය ආරම්භ වී වසර දෙකකින් ඉක්බිතිව සභාපතිවරයා විසින්, කවර හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් මෙම ආඥාපනතේ 168 වන සහ 169 වන වගන්ති අනුව කටයුතු කිරීමෙන් අනතුරුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයේ සියලුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එකතු කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අයවැය ලේඛනය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු ය. එය එසේ දෙවන වරටත් නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලය අවසන් වීමෙන් පසුව සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.